# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

### කැළණි වැලි දුම්රිය මාර්ගයේ EN 45 E1 රේල්පීලිවලට ගැළපෙන LESS HIGH CONCRETE SLEEPERS 5000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය - IFB අංක - SRS F.7933

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමෙන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කැළණි වැලි දුම්රිය මාර්ගයේ **EN 45 E1 රේල්පීලිවලට ගැළපෙන LESS HIGH CONCRETE SLEEPERS 5000ක් සැපයීම** සඳහා දේශීය නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2 ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය (NCB) අනුව සිදු කෙරෙනු ඇත.

3 උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට **2023.12.18 සිට 2024.01.11** දක්වා **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** වැඩ කරන දිනයන්හිදී පහත දක්වා ඇති ලිපිනයෙන් වැඩි දුර තොරතුරු ලබාගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකි ය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය),**
**දුම්රිය මාර්ගය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94 (11) 2438078 හෝ 94(11) 2436818** |
| **ෆැක්ස් අංකය** | : | **94(11) 2432044** |
| **ඊ මේල්** | : | **srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

4. ලංසුකරුවා ශ්‍රී ලංකා දුම්රිය සේවයට Concrete Sleepers 5000 කට වැඩි ගණනක් සපයා තිබිය යුතු ය, නැතහොත් **රු.මිලියන 50 කට වැඩි** වටිනාකමින් යුත් පෙරැඳි කොන්ක්‍රීට් බිම් සපයා තිබිය යුතු ය. එසේ නැතහොත් පසුගිය වසර පහක (5) කාලය තුළ **රු.මිලියන 500 කට නො අඩු** අගයකින් යුතු කොන්ක්‍රීට් කණු සපයා තිබිය යුතු ය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2023.12.18 සිට 2024 01.11** දක්වා **ප.ව.3.00 තෙක් නැවත ගෙවනුනොලබන රු.32,000/-** ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයට යොමු කිරීමෙන් **ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්** මිල දී ගත හැකිය.

6. සෑම ලංසුවක්ම ලංසු ආරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු සුරක්ෂණ මුදල **රු. 1,800,000.00 ක්** විය යුතු අතර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතු ය.

7. **2024.01.12 ප.ව.2.00 හෝ එදිනට පෙර** පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**
යොමු අංකය : SRS/F. 7933